

නුවරඑළිය ලෝකයට දයාද කළ සුදු ජාතිකයා

ඉංග්‍රීසි ජාතික ලේඛකයන් විසින් ශ්‍රී ලංකාව ගැන ලියා ඇති ග්‍රන්ථ බොහෝමයකට පසුබිම වී තිබෙන්නේ මෙරට ස්වභාවික සෞන්දර්යයෙන් කෙබි වනාන්තර වන සීපාවා හා එම වනාන්තර ආශ්‍රිතව දිවි ගෙවූ අසරණ ගැමියන් පිළිබඳ හොරතුරුය. විශ්ව වන ඝාතිත්‍යය පෝෂණය කිරීමට එදා බවුන් දුන් දායකත්වය අද වන් යුගයක ඉහළින්ම කැපී පෙනෙයි. පරිසර සම්පත් 'අවුකොස්ට්' යන මෙතුල අහිතයේ කෑ සැණිවරකාවක් සේම බවුන්ගේ ඒ පත යෙහෙ රසවින්ත.

දඩයම් ජීවිතයක් ගෙවා වගාවන් එකම විනෝදයෙය කර ගත් ප්‍රසිද්ධ ලේඛකයකු ලෙස සර් සැමුවෙල් බේකර්ගේ නම මෙතිලා විශේෂයෙන් සඳහන් කළ හැකිය. ගත සිත පුබුදු වන සැදෑයි ප්‍රදේශයක් ලෙස නුවරඑළිය ජනප්‍රියතාවට පත් කිරීමට මුල් වූ පිරිස අතරින් ප්‍රමුඛස්ථානය හිමි වන්නේ සර් සැමුවෙල් බේකර්ය. ලංකාවේ වන මං ඔස්සේ පිටමං කර ලබා ගත් අත්දැකීම් නිසාම පසු කාලයක අප්‍රිකානු දේශ ගවේෂණයේ යෙදුණු සර් සැමුවෙල් බේකර් අවසානයේදී නයිල් ගඟේ ආරම්භක ස්ථානය සොයා ගත් ප්‍රථමයා ලෙස ලෝක ඉතිහාසයට එක් විය.

1821 ජූනි මස 08 වන දින්හවදේදී උපත ලද මේ දේශ ගවේෂකයා එංගලන්තයේ දී හා ජර්මනියේදී අධ්‍යාපනය ලබා 1944-46 කාලය මුරිසි දිවයිනේ ගත කළේය. වන සතුන් ගහන ගණ වනාන්තරයෙන් වැළඳුණු පෙරදිග උඩම්ම ලෙස එකල ඉංග්‍රීසි ජාතිකයන් අතර ප්‍රසිද්ධියට පත්ව තිබුණු ලංකාව ගැන තමන්ට අසන්නට ලත් විස්තරවලින් පැහැදුණු සැමුවෙල් බේකර් 1847 දී ලංකාවට පැමිණියේය. එවකට ඔහු 27 හැවිරිදි තරුණයෙකි. ලංකාවේ භූමි සිතියම් හා වනාන්තර පිළිබඳ තොරතුරු අධ්‍යයනය කළ මේ තරුණයා හොඳෝ දිනකින්ම නුවරඑළිය බලා ගියේය.

සුදෝ සුදු මීදුමින් වැසිගිය සීතල කඳුකරයක් ගත සිත පිනවන මනරම් භූ දර්ශනත් දැක චිත්ත ප්‍රසාදයට පත් බේකර් 'මේ නම් ඉංග්‍රීසි ජාතිකයන් නෙතුලවන්ම දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කරන ලද වංගලන්තයක් මිස අන් කුමක් දැයි' සිතා ගණ වනයෙන් වැසුණු ඒ නුවරඑළිය ඉංග්‍රීසි ජාතිකයන්ගේ නව ජනපදයක් කිරීමට අධිෂ්ඨාන කර ගත්තේය.

සති දෙකක් නුවරඑළියේ ගත කළ ඔහු ආපසු කොළඹට පැමිණ නිවසෙන් කුලියට ගත්තේය. එතැන් පටන් ලංකාවේ ගම් දනව් වනාන්තර කඳු බැටි ගංගා හැම තැන ගවේෂණය කරමින් ඇවිදුන්දෙය. මෙසේ මහ දෙළොසක් ලංකාවේ ගත කළ බේකර්ගේ එකම විනෝදාංශය වූයේ දඩයමෙයි. මැලේරියාවෙන් පෙළෙමින් දඩයමින් ගත කළ දෙළොස් මසක් ලෙස මේ කාලය බේකර් විසින්ම හඳුන්වා දී තිබේ.

ආපසු එංගලන්තයට ගිය බේකර්ගේ සිතට නිදහසක් නොවීය. ලංකාවේ ගත කළ කාලයේ නුවෙකලාව වනාන්තර ප්‍රදේශවල දඩයම් සොයා ගිය හැටින් නිසැර වන පෙත සසල කරමින් තම රයිෆලයේ හඬ දෝංකාර දුන් හැටින් මුවන්, ගෝණුන් තමන්ගේ නොව දැවැන්ත අලි ඇතුන් පවා ඒ වෙඩි හඬ සමග ඇද වැටුණු ආකාරයත් ඔහුට මැවී පෙනුණේය. මේ නිසාම නැවත ලංකාවට පැමිණීමේ ආශාව එක් දිනකින් හෝ පමා කිරීමට බේකර්ගේ සිත ඉඩ දුන්නේ නැත.

යටත් විජිත භාර මහ ලේකම්වරයාගේ කාර්යාලයට ගොස් අක්කරය සිලිං විස්ස බැගින් නුවරඑළියෙන් සැගෙන ඉඩම ප්‍රමාණයක් මිලට ගත් බේකර් තමා සමග ලංකාවේ පදිංචියට ඒමට කැමැති තිහවත් පවුල් කීපයක් ද ගමනට සූදානම් කර ගත්තේය. ඉන් පසු තම අනාගත ගොවිපොළ සඳහා අවශ්‍ය උපකරණ එළවළු හා පළතුරු බීජ, ධාන්‍යාදී වර්ගයේ එළදෙනක හා ගවයකු බැටළුවන් කීපිය දෙනෙකු අස්වයකු හා දඩයම් බල්ලන් ද මිලට ගෙන ඒ සියල්ල සමග හිව ජනාවදික පිරිස ද ලංකාව බලා එන නැවකට බාර දුන් බේකර් කල්තියාම ලංකාවට පැමිණියේය.

නුවරඑළිය නගරයේ සිට සැතපුම් දෙකක් එපිට සුව දායක තැනිතලා ප්‍රදේශයක් (සඳුනුන්හ) තෝරාගත් ඔහු කුලී කරුවන් විශාල පිරිසක් යොදවා කැලෑ එළි පෙහෙළි කර නොබෝදෝ දිනකිනම් සුව පහසු නිවාස කීපයක් ඉදිකරවිය.

ආගන්තුක පිරිස රැගත් නෞකාව 1848 නොවැම්බර් මස කොළඹට ළඟා විය. නුවරඑළිය දක්වා සයිත්ත සැතපුම් 115 ක දුෂ්කර ගමනක යෙදෙන අවස්ථාවේදී සතුන්ගෙන් සමහරෙක් අතරමං මියගියහ. අධික වෙහෙසේ දැඩි උණ්ණත්වයත් විඳ දරා ගැනීම සතුන්ට අපහසු විය. ඇතුන් බැඳි ගැල් යොදගෙන ගිය මෙම අවසානයේ සෙසු පිරිස සුව සේ නුවරඑළියට ළඟා වී නව ජනපද ජීවිතය ආරම්භ කළහ.

ආහාරයෙන් සතුන් ද විඳේඛීය එළවළු බෝග ද යොදගෙන ප්‍රථම වරට ලංකාවේ ගොවි පොළ තුළයේ ආරම්භ කිරීමට ගත් සාර්ථක උත්සාහයක් ලෙස බේකර්ගේ මෙම ව්‍යාපෘතිවලද හඳුන්වා දිය හැකිය. අඳුන් උඩරට ප්‍රදේශවල ප්‍රධාන වශා බෝග බවට පත්ව ඇති කෑරට්, බීට්, ගෝවා ලංකාවට මුලිනම හඳුන්වා දීමේ ගෞරවය බේකර්ට හිමි වෙයි. බේකර් ලංකාවට ගෙනාවේ ඔහුගේ ගොවිපොළ කුරිය හා නව ජනපද රටාව පමණක් නොවේ. වෙනදේශීදී දැවෙන්ම ජීවිතය ද ඒ අතර ප්‍රධාන වෙයි. (අදට නොගැළපෙන්නක් වුවත් ඒ යුගයේ හැටියට) ගොවිපොළ ආරම්භ කිරීමෙන් ඉතිහාසිකි ඔහු කළුකර ප්‍රසිද්ධ දඩයිමක් වූ හෝර්ටන්තැන්නේ හෝ ගණන් දඩයම් කිරීමට පටන් ගත්තේය. එංගලන්තයෙන් රැගෙන ආ දඩබල්ලන් මේ සඳහා යොදු ගැනුණි.

18 වන ශත වර්ෂය අග භාගය වෙන විට දඩයම ලංකාවේ හොඳම ක්‍රීඩාව බවට පත්ව තිබිණි. එයෙයින් බේකර්ගේ දඩයම් දිවිය හෝර්ටන්තැන්නෙහි පමණක් සීමා නොවීය. හොඳ දඩයම් සොයා ඔහු සහභාගි ප්‍රදේශ ද ගවේෂණය කළේය. 1847 සිට 1855 දක්වා වසර අටක් බේකර් ලංකාවේ රැඳී සිටියේය. එද ලංකාවේ අලි ඇතුන් මරා දැමීම දිරි ගන්වනු වස් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් දඩයක්කරුවන්ට තාහන පිරිනැමීම අලි ඝාතනය ඉහළ යාමට සෘජුවම බලපෑවේය. මරා දමනු ලබන සත් අලියකුගේ වල්යයකට සිලිං දහය බැගින් රජය ගෙවූ අතර මේ නිසාම කොපමණ අලි ඝාතනයක් මරා දමනු ලැබුවේද යන්න එතැන් රජයේ ව්‍යාඛ්‍යාන ආදායම් පියවා ගැනීමට එය බාධාවක් වූ බව බේකර්ම පවසයි.

එද රජයේ ඉඩම් අක්කරයක් සිලිං විස්සකි. අලි ඉදෙනකු මරා පසුසැවෙන්ම ඉඩම් අක්කරයක් මිලදී ගත හැකි විය. අලි දඩයම් හොඳ ආදායම් මාර්ගයක් වූ නිසාම තුවක්කු භාවිත කරන පිරිස ද ක්‍රමයෙන් ඉහළ ගියේය. අවසානයේදී ස්වදේශිකයන් අතින් ද ඇත පිටිසර වනාන්තර තුළදී විශාල වශයෙන් අලි ඇතුන් මරුමුවට පත් වූ බව වාර්තා වෙයි.

සැමුවෙන් බේකර්ගේ සංවාරක ජීවිතය හුදෙක් විනෝදයට පමණක් බර නොවීය. ලක් පොළඹෝවෙන් රහුන් සොයා ගැනීමේ පිළිබඳව විස්තරයක් මුලින්ම ලක්ෂ්‍යයට ඉදිරිපත් කර ඇත්තේ ද බේකර් විසිනිය. සැමුවෙල් බේකර් ඉතාමත් නීතිඥයෙ බුද්ධිධාකිනි කටයුතු කළ පුද්ගලයෙකි. ඉංග්‍රීසි ජාතික ව්‍යවිධිකරුත්වේ හා යුදු තරයන්ගේ ඉයෝජනය සඳහා නුවරඑළියේ කියවීම් ශාලාවක්, විශාල ශාලාවක් හා දේවස්ථානයක් ද මිනු ඉදිකරවිය. ඉංග්‍රීසි පාලනය යටතේ ලංකාව ශීඝ්‍ර දියුණුවක් කරා ගමන් කළ බව පවසන බේකර් ඇතැම් ආණ්ඩුකාරවරුන්ගේ උදාසීනත්වය නිසා එම දියුණුවට බාධා ඇති වූ බව උදාහරණ ගෙන හැර පාමින් නිර්භයව පෙන්නුම් කර ඒ ඇත.

සර්. ජී. ඇන්ඩ්‍රිස්සන් හා සර් ඩබ්ලිව්. ගෝර්ටන් යන ආණ්ඩුකාරවරුන්ගේ පාලන කාලය රටට දුර්භාග්‍යය හා දීමිට හේතුවූ බව බේකර් සඳහන් කරයි. ඇන්ඩ්‍රිස්සන් ඇමතන් දුර්වල ආණ්ඩුකාරයෙකි. ඔහුගේ විශ්වාස්කාමී දිවි පාවෙන නිසා රටේ පොදු සුභ සාධන සේවා රාශියක් ඇණහිටියේය. මංමාවත් ඔබලන් වී ගමනාගමන සේවා පිරිහී ගියේය, නමුත් තමා රාජාා භාණ්ඩාගාරයට පවුම 27000 ක් ආහිරි කර දුන් බවට ඇන්ඩ්‍රිස්සන් උදම් ඇතු බව බේකර් සඳහන් කරයි.

සිංහල රාජ්‍ය සමයේ පටන්ම මුතු කිමිදීම ලංකාවට හොඳ ආදායම් මාර්ගයක්ව පැවැතියේය. පාතුතිසි ලන්දේසි පාලන සමයන්හි පවා රාජ්‍ය ආදායමින් වැඩි කොටසක් ලබා ගත්තේ මුතු පරම්පරිත්ය. ඉංග්‍රීසින් මුතුලබා ගැනීමේ හොඳ රාජ්‍ය ආදායමක් ලබා ගත් බව පවසන බේකර් එය රජයට රහසිදුම් දුන් හංසයකුට සමාන කරයි. සර් ගෝර්ටන් මේ රහ හංසයා මරා බිඳු ලබා ගැනීමට උත්සාහ කළ දුර්වල ආණ්ඩුකාරයකු ලෙස බේකර්ගේ දෝෂ දර්ශනයට ලක් වී තිබේ. සැමුවෙල් බේකර් ලංකාවේ ගත කළ නිදහස් විනෝදජීවී ජීවිතයේ සාර්ථකත්වය ඇඳුරියට ගත් එංගලන්තයේ ඉහළ ම මධ්‍යම පාන්තික ජන කොටස් ලංකාවට ඇදී ඒමට පටන් ගත්හ. එකී ප්‍රතිඵලයක් ලෙස කඳුකරය වසා ගත් ගණ වනාන්තරය එළි පෙහෙළි වී ඒ මත වතු වගා ක්‍රමය ව්‍යාප්ත වී ගියේය. බේකර් ලංකාවේ ගත කළ අට වසර තුළ ග්‍රන්ථ කීපියෙක්ම ලියා පළ කළේය. 1853 දී ඔහු විසින් ලියන ලද රයිෆල් ඇන්ඩ් හවුන්ඩ් ඉන් සිලෝන් හා 1855 දී ලියන ලද එයිට ඉයර්ස් ෆොන්ඩ්‌රිංස් ඉන් සිලෝන් යන ග්‍රන්ථ මේ ආතරින් ප්‍රසිද්ධියට පත් ඡගතා කෘතීන්ය. ලංකාවේ ගණ වනාන්තර තුළ ඇවිද අදී ඇතුන් දඩයම් කිරීම පිළිබඳ අනුවෙදනීය විස්තරත් වනගතව දිවි ගෙවූ අසරණ ගැමියන්ගේ විචාරාර්ථ ජීවන අරගලයන් ඔහු සිය ග්‍රන්ථ තුළින් මනාව මූවා දක්වා තිබේ.

සැමුවෙල් බේකර්ගේ ජීවිතයේ සැබෑ ජයග්‍රහණයන් ඔහු කරා ළඟා වූයේ උන් දිවියේ ඔහුට ගත කළ අට අවුරුදු කාලය අවසානයේදීය. ඒ වන විට බේකර්ගේ නම ගරු ලෝකයා අතර ඉතාමත් ප්‍රසිද්ධියට පත්ව තිබුණේය. සැබෑවුණු ලෝකය සොයමින් ගවේෂණ චාරිකාවල යෙදෙන පිරිස් අප්‍රිකානු මහඋවිය වෙත වැඩි අවධානයක් යොමු කර තිබුණේ ද මේ වකවානුවේදීය. මෙම ගවේෂණයන්ට එක්වීමේ බලාපොරොත්තුවෙන් බේකර් 1856 දී ලංකාවෙන් සමුගන්නේය.

මුලින්ම සොහන්නාත්තියෙන්පල්වලටත් එතැනින් ක්‍රිමියාවටත් ගිය සැමුවෙල් බේකර් එතිදී කර බුහුදු හා ඩැනියුබ් නදිය සමබන්ධ කිරීමට ඉදිකරමින් තිබුණු දුම්රිය මාර්ගයේ වැව පරීක්ෂකවරයා ලෙස රාජකාරිය භාර ගත්තේය. කඳු, වන දුර්ග මැදින් තැනූ මේ මාර්ගය නිසා ඔහුගේ වනගත ජීවන අත්දැකීම තව තවත් පරිපෝෂණ විය. 1861 මාර්තු මාසයේදී ඔහු සිය ධෛර්ය අධිෂ්ඨාන චාරිත්‍රවාර ආරම්භ කළේය. නයිල් ගංගාවේ ආරම්භක ස්ථානය සොයා ගැනීමත් කැප්ටන් ස්පෙක් හා ග්‍රාන්ට්ගේ මෙහෙයවීමෙන් වික්ටෝරියා වීදුරු ප්‍රදේශයේ ගවේෂණ කටයුතු කරමින් සිටි නැගෙනහිර අප්‍රිකානු ගවේෂණ කණ්ඩායම මුණ ගැසීමත් බේකර්ගේ ගවේෂණයන්හි උපය.

සුඩානේ ඇබිසීනියානු දේශ සීමාවේ අවුරුද්දක් පමණ ගත කළ ඔහු ඔහු කාලය තුළ අරාබි බස හොඳින් ඉගෙන ගත්තේය. ඒ අතරතේ ඔහු ඇඹරුවට ආපුල නයිල් ගංගාවේ ප්‍රධාන අත ගංගා සොයාගෙන ඒවා සිතුවම් ගත කරමින් නයිල් ගංගාවේ බොර දිය ඇබිසීනියාවේ සිට ගලා එන බව ලොවට එළිදරව් කළේය. පසුව කාටුම් නගරයට පැමිණි බේකර් 1862 දෙසැම්බර් මාසයේදී සුදු නයිල් නදිය සෙවීම සඳහා ගමන් ආරම්භ කළේය. මෙසේ ගමන් කරමින් සිටියදී මාස දෙකකට පසුව ගොන්කැරා ප්‍රදේශයේ දී ඔහුට ස්පෙක් හා ග්‍රාන්ට් මුණගැසිණි. ඒ දෙදෙනා නයිල් ගංගාවේ ආරම්භක ස්ථානය සොයා ගොන ගග ගස්සේම ඊජප්තුව බලා ගමන් කරමින් සිටියහ.

මෙම ආරුඩිය බේකර්ගේ කනස්සල්ලට හේතුවක් විය. තමාගේ ගවේෂණ කටයුතු නිශ්චල වූ බව සිතූ බේකර් නයිල් ගංගාවේ කවත් සෙවීමට දෙයක් තමාට ඉතිරි වී නැහැයැයි සිතා පසුතැවිලි විය. නමුත් ස්පෙක් හා ග්‍රාන්ට් තාගගිලී ලෙස බේකර්ට කවත් ආරුඩියක් දුන්න. එතම එතෙක් හෙළිදරව් නොවූ ඇල්බට නියංසා විල සොයා ගන්නා ලෙස ඔවුනු බේකර්ගෙන් ඉල්ලා සිටියහ. ඒ හෝඩුවාව මස්සේ වසරකට අධික කාලයක් නිස්සේ අතිදුෂ්කර ගවේෂණ කටයුත්තක යෙදුණු බේකර් 1864 මාර්තු 14 වෙනි දින නයිල් ගංගාවේ මුල උල්පත වන ඇල්බට නියංසා විල සොයා ගත් ප්‍රථම ගවේෂකයා ලෙස ලෝක ඉතිහාසයට එක් විය. මේ නිසා බේකර් ස්පෙක්ගේ හා ග්‍රාන්ට්ගේ විසිඳිට ප්‍රශංසාවට ලක් විය. තව දුරටත් ඇැබට නියංසාවේ ගවේෂණයන්හි නියැළී සිටි බේකර් 1865 මැයි මාසයේදී ආපසු කාටුම් නගරයට පැමිණියේය.

එම අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදී එංගලන්තයට පැමිණි බේකර්ට රාජකීය භූගෝලීය සංගමයෙන් හා පැරිස් භූගෝලීය සංගමයෙන් ද රන් පදක්කම පිරිනැමිය. 1866 දී ඔහු නයිට පදවියකින් පිදුම් ලැබිය. එම වසරේම ද ඇැබට නියංසා ළඟට බෙඩින් ගේ ද නයිල් සහ එක්ස්පෙරේන්ත් ගේ ද නයිල් සෝසස් නමැති ග්‍රන්ථ ද 1867 දී නයිල් ත්‍රිත්‍රියුරිස් ගේ ඇබිසීනියා නම් ග්‍රන්ථය ද ඔහු ප්‍රකාශයට පත් කළේය. මෙම පොත් දෙකේ ඕදුණයෙන් කිපයක්ම අක්ෂරිකෘත් අලෙවි වීම නිසා 1868 දී කාසට් අප් බයි ද ඩී නම් ප්‍රසිද්ධ කතාව ප්‍රකාශයට පත් කරමින් ඔහු විශ්ව කීර්තියක් දේකකයකු බවට පත් විය.

1869 දී ඊජප්තුවට ගිය සැමුවෙල් බේකර් කැඩිව ඉස්මයිල් නම් ඊජප්තු නායකයාගේ ඇල්ලීම අනුව එරට යුධහමුදුවේ අණ දෙන නිලධාරී තනතුරක් භාර ගත්තේය. එහි පරම්පරිය වූයේ නයිල් ගඟේ නිරන්තර කලපාවේ එවකට පැැවති වහල් වෙළඳාම් තනත කර එරටෙ නව වාණිජ ශිෂ්ටාචාරයක් නැගීමය. 1700 ක ඊජිප්තු හට හමුදාවක් සමග කරියෝ නායකයෙන් වූ බේකර් එම හමුදාවෙහි මේජර් පදවියේ තනතුරට පත් කරනු ලැබූ අතර ඊට අමතරව වහලකට වඩුම් ගය දකන වැටුපක් සහිතව එරට නව දේශ සීමාවෙ ආණ්ඩුකාරයා ලෙස ද ඔහු පත් කරනු ලැබිණ.

වසර හතරක් එහි සේවය කිරීමෙන් අනතුරුව 1874 දී නැවත එංගලන්තයට පැමිණි සර් සැමුවෙල් බේකර් සැෂ්ඩ් ෆෝට්ව් මිවර්ලේහි ඉඩමක් මිලදී ගෙන නිවෙසක් තනා තම ජීවිතයේ ඉතිරි කාලය බිරිඳත් සමග නිස්කලංකව ගත කළේය.

1874 දී ඉස්මයිලියා නමින් තම මධ්‍යම අප්‍රිකානු ගවේෂණය පිළිබඳවද 1879 දී සයිප්‍රස් ඇස් අයිසෝ නමින් සයිප්‍රස් ද්‍රවක ගැන ද ග්‍රන්ථ දෙකක් ලියා පළ කළ සර් සැමුවෙල් බේකර් අත් පසු රොගී කඳුකරය, ඉහදිඩාව, ඊජප්තුව සහ ජපානය වැනි රටවල කිහිප වරක්ම සංචාරය කර 1890 දී තමාගේ අවසන් ග්‍රන්ථය වයිල්ඩ් බීස්ට්ස් ඇන්ඩ් දෙයාර්වේස් නමින් ප්‍රකාශයට පත් කළේය.

ශ්‍රී ලංකාවේ ගණ වනාන්තර තුළින් දඩයම් ජීවිතය ආරම්භ කර අවසානයේ නයිල් ගංගාවේ සැඟවුණු අභිරහස් ලොවට එළිදැක්වීම කරමින් විශ්ව කීර්තියට පත් කළේ අසහාය දේශ ගවේෂකයා 1893 දී තම මාතෘ භූමිය වන එංගලන්තයේදී අවසන් හුස්ම හෙළුවේය.

කැමිලස් වනිගසූරිය